# වෙහෙරබිඳ-බැඳි වැව: ග්‍රාමීය ප්‍රදේශවල සමාජ නවීකරණය හමුවේ බෞද්ධ උරුම අභියෝගයට ලක්වීම පිළිබඳ විමර්ශනයක්. (මොනරාගල නාලාගිරි පබ්බත විහාරය ඇසුරිණි)

මහින්ද බණ්ඩාර[1]
රූපිකා ගමගේ[2]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවෙහි සෑම පෙදෙසකම පාහේ අතීතයේ පටන්ම ජනාවාස පැවති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි රැසක් හමුවේ. එයින් බෞද්ධ සිද්ධස්ථාන හා බැඳීගිය නටබුන්වලට වැදගත් තැනක් හිමිවේ. එසේ වුවද වර්තමානය වන විට විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ආගමික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ද වැදගත් ස්මාරක හා පුරාවිද්‍යාත්මක සාක්ෂි සහිත භූමි විශාල ප්‍රමාණයක් විනාශ වී යෑමේ තර්ජනයට මුහුණ දී තිබේ. තණමල්විල නාලාගිරි පබ්බත ආරණ්‍ය භූමිය ද වැදගත් පුරාවිද්‍යාත්මක භූමියක් ලෙසින් පෙන්වා දිය හැකිවේ. හාත්පසින්ම කෘෂිකාර්මිකකරණයට නතු වූ භූමි භාගයක් මැද හුදකලා කඳු ගැටයක් ලෙසින් පවතින පුරාභූමියෙහි ලාංකේය ශ්‍රී විභූතිය විදහා දක්වන පුරාස්මාරක සහ පුරාවිද්‍යා සාක්ෂි රාශියකි. මෙම පුරා භූමියෙහි පවතින්නා වූ පුරාවිද්‍යාත්මක වටිනාකමත් විවිධ මානව ක්‍රියාකාරකම් නිසා විනාශ වී යන පුරාවිද්‍යාත්මක උරුමයත් හෙළිදරව් කර ගැනිමේ අටියෙන් 2013 වසරේ ජුනි මස දී මූලික පුරාවිද්‍යා ගවේෂණයක් සිදුකරන ලදි. එම මූලික පුරාවිද්‍යා ගවේෂණයේදී ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමය භාවිත කළ අතර හායනයට හා විනාශයට පත්ව ඇති පුරාවිද්‍යාත්මක ස්මාරකයන් රැසක් හෙළිදරව් කර ගැනීමේ හැකියාව ලැබිණි. මෙම අධ්‍යනයේ දී ස්තූපය බිඳ දමා නාලාගිරි පබ්බත විහාරයේ වැව් බැම්මක් ඉදිකර ඇති අතර බහුතරයක් හෝ සම්පූර්ණයෙන්ම බෞද්ධයින් ජීවත්වන මෙම ප්‍රදේශයේ සිදුව ඇති පුරාවිද්‍යා විනාශය නවීකරණය හමුවේ ග්‍රාමීය ජන චින්තනය වෙනස් වීමේ ප්‍රතිඵලයක් බව පෙනීයයි. සමාජ වෙනස්වීම සමග පුරාවිද්‍යා ස්මාරක පිළිබඳ අවධානය වෙනස්ව යන අන්දම මෙම සිදුවීමෙන් පෙනීයයි.

## පර්යේෂණ ගැටලුව

මූලික පුරාවිද්‍යා ගවේෂණය සැළසුම් කිරීම සඳහා පර්යේෂණ ගැටලුව සැකසීමේ දී මානව ක්‍රියාකාරකම් නිසා තණමල්විල කිවුල්ආර නාලාගිරිපබ්බත

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. methmalmahindatt@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.

ආරණ්‍ය භූමියෙහි පුරාවිද්‍යාත්මක විනාශය කෙරෙහි අවධානය යොමුවිය. එහි දී " සමාජ නවීකරණය පුරාවස්තු කෙරෙහි බලපා ඇත්තේ කෙසේද?"යන අධ්‍යන ගැටලුව කෙරෙහි සැලකිලිමත් වූ අතර සංවර්ධන අරමුණින් ඉදිකළ මෙකී වැව මගින් අදාළ ස්තූපය විනාශ වීම කෙරෙහි බලපෑ කරුණු විමසීම සිදුවිය.

**අධ්‍යයන අරමුණ**

මෙම මූලික පුරාවිද්‍යා ගවේෂණය සිදු කරීමේ මූලික අරමුණ වූයේ පුරාවිද්‍යාභූමියෙහි පවතින පුරාවිද්‍යා ස්මාරක සහ නටඹුන් වලට සිදුව ඇති මානව බලපෑම පෙන්වා දීමයි. එමඟින් අදාළ පුරාවිදු භූමියෙහි මානව ක්‍රියාකාරකම් නිසා විනාශවී ඇති පුරාවිද්‍යාත්මක උරුමය හෙළිදරව් කරගත හැකිවේ. එසේම මෙම භූමියෙන් හමුවන පුරාසාධකයන් පිළිබඳව කාලාවලියක් සැකසීමද පුරාභූමියෙහි විසිරි ඇති ස්මාරක හා අවශේෂයන්ගේ අගය හඳුනා ගැනීම හා එය තක්සේරු කිරීම මෙන්ම විධිමත් පුරාවිද්‍යා කටයුතු සඳහා මෙම පුරාවිද්‍යා භූමිය පිළිබඳ තොරතුරු පුරාවිදුවන්ගේ දැසට හෙළිදරව් කර දීමද මෙහි අවශේෂ අරමුණු විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමය ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේදය වූ අතර එහි දී ක්ෂේත්‍ර ගවේෂණය (Field survey) භාවිතයට ගැනුණි. නියදි රැස් කිරීම, සැළසුම් ඇඳීම, ඡායාරූප ගැනීම, පවතින පුරාවස්තු විමර්ශනය හා වර්ගකිරීම ආදී කාර්යයන් ගවේෂණය අතරවායේ දී සිදුකරන ලදී. මෙම මූලික ගවේෂණය සිදුකරන ලද්දේ ක්ෂේත්‍ර සකස්වීමේ ක්‍රියාවලිය පිළිබඳව වැඩි අවධානයක් යොමුකරමිනි.

**භූගෝලීය පිහිටීම හා ඓතිහාසික පසුබිම**

මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 147 සී කිවුල්ආර ගම්මානයේ මධ්‍යයේ හුදකලා කඳු ගැටයක් මත මෙම පුරාවිද්‍යා භූමිය පවතියි. ප්‍රදේශයේ ජනතාව මෙහි ඓතිහාසික තත්වය පිළිබඳ දඹදෙණි යුගය හා සම්බන්ධව විවිධ ජනප්‍රවාද ගොඩනගාගෙන තිබුණ ද මෙහි දැකගත හැකි පුරාවිද්‍යා ස්මාරක හා නටබුන් තුළින් පැහැදිලි වනුයේ මෙය අනුරාධපුර යුගයට සමකාලීනව රෝහණ රාජධානියට කිසියම් සබඳතාවයක් පවතින බවයි. මෙහි පවතින පුරා සාධකයන් අනුරාධපුර ශෛලිය සමග සැසඳීමේදී බෙහෙවින්ම සමාන ලක්ෂණ පෙන්වන බව දැකගත හැකිවේ.

## නාලාගිරි පබ්බත විහාරයේ පුරාවිද්‍යා උරුම විනාශය

ගවේෂණය සිදුකිරීම තුළින් පුරාවිද්‍යා භූමියෙහි මානව ක්‍රියාකාරකම් නිසා විනාශවී ඇති පුරාවස්තු කිහිපයක් හඳුනාගත හැකිය. ඇතැම් පුරාවස්තු හායනයකට ලක්වී ඇතිබව දැකගත හැකි අතර ඇතැම් පුරාවිද්‍යාත්මක සාධකයන්ගේ යථාභූතීභාවයට හානියක් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවී ඇති අන්දම හඳුනාගත හැකිවේ. මෙහි දී ආරණ්‍ය සංකීර්ණයේ පැවතියා වූ ස්තූපය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමුවිය. කාලයාගේ ඇවෑමෙන් වල්බිහිවීගිය ස්තූපය නිදන් හොරුන්ගේ ග්‍රහණයට හසුවී ඇතිබව එය මධ්‍යයේ ඇති අඩි අටකටත් වඩා විශාල වළ තුළින් තහවුරු විය. තවද ප්‍රදේශයේ විවිධ ඉදිකිරීම් සඳහා මෙහි ගඩොල් ගලවාගෙන ගොස් ඇතිබවද නිරීක්ෂණය විය. එසේම මෑතකාලීනව ඉදිකරන ලද වැව්බැම්මකට මෙම ස්තූපය ඇදා තිබීම නිසා මෙහි යථාභූතිභාවයට මෙන්ම ස්තූපයේ පැවැත්මට දැඩි තර්ජනයක් එල්ල වී ඇත. එසේම මෙහි ප්‍රධාන වශයෙන්ම කටාරම් කෙටූ ගල්ලෙන් හතක් පමණ දැකගතහැකි අතර ඒවායින් ප්‍රධාන ගල්ලෙන් තුනක්ම මේ වන විට මෑත කාලීනව ඉදිකළ ඉදිකිරීම් නිසා විනාශවී ඇත. එවායෙහි ඉහළ බිත්තියෙහි මෑත කාලීනව ආලේප කළ හුණු බදාමය අතරින් පැරණි සිතුවම්වල සලකුණු දැකගත හැකිය. මෑතකාලීනව ඉදිකිරීම්වලදී කටාරමට ද හානි සිදුවී ඇත. තවද මෙහි පර්වතවල කොටා ඇති යම් යම් සලකුණු අවට මෑතකාලීනව කෙටූ සලකුණු නිසා ඒවායෙහි ද යථාභූතීභාවයට හානි සිදුවී ඇති බව පැහැදිළිය. කෙසේ වුවද මෙසේ හඳුනාගත හැකි ලක්ෂණයන් තුළින් පැහැදිලිව පැවසිය හැක්කේ මෙම පුරාවිද්‍යා සංකීර්ණය කෙරෙහි මෙතෙක් කලක් පුරාවිදූවන්ගේ දෑස් යොමු නොවී පැවතීම ද මෙම මානව ක්‍රියාකාරකම් වලට හේතු වන්නට ඇති බවය. කෙසේ වුවද අනුරාධපුර යුගයට සාපේක්ෂව රෝහණයේ ජනාවාසකරණයක් මෙන්ම බෞද්ධ විහාරාරාම රාශියක් ද පැවති බවට දිය හැකි කදිම නිදසුනක් වන මෙම පුරාවිද්‍යා භූමියෙහි පුරාවස්තූන්ට මානව ක්‍රියාකාරකම් නිසා දැඩි හානියක් සිදුවී ඇති බව තවදුරටත් දැක්විය හැකි වේ.

## වෙහෙර බිඳවැව් බැඳීම

ශ්‍රී ලංකාවේ අතීත සංස්කෘතිය සකස් වීමේ දී වැව, දාගැබ, ගම හා කෙත්වතු එකම ඒකකයක් ලෙස පැවතීම ගම්මාන වල දැකිය හැකි වූ අතර මෙම ඒකකය ආගමික මධ්‍යස්ථානය පෝෂණය කිරීමට එකසේ වැදගත් විය. විහාර, ආරාම නඩත්තු කිරීම සඳහා ධනෝපායන මාර්ග ලෙස විහාර වලට වැව් පූජා කිරීමේ ව්‍යවහාරය ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම පැවති බවට සාධක හමුවේ.නමුත් වැව් ඉදිකිරීමේ දී ස්තූප විනාශ කිරීමට අතීත ලාංකිකයන් කටයුතු නොකළ නමුත් දැඩි පුරාවිද්‍යා නීති පවතින මෙම වකවානුවේ දී ද ග්‍රාමීය ජන කණ්ඩායමක් ස්වකීය වැවක් ඉදිකිරීමට වෙහෙරක් බිඳ ඇති බවට වන වැදගත් නිරීක්ෂණයන් මෙම අධ්‍යනයේ දී අපට හමුවිය.විහාර සංකීර්ණයේ එක් පසක ඇති නිදන්

හොරුන්ගේ ග්‍රහණයට හසු වී හාරා විනාශ කර දැමූ ස්තූපයට බස්නාහිර දෙසින් මීටර් පණහක පමණ දිග වැව් බැම්මක් සම්බන්ධ කර ඇත. මෙම වැව් බැම්මේ ඉදිකිරීම් සඳහා ද යොදාගෙන ඇත්තේ ස්තූපයේ ගැලවීගිය ගඩොල්ය. වර්ග මීටර් සියයක පමණ ස්තූපයේ නටබුන් විසිර පවතින අතර ඒ අසලම කොරවක්ගල් කොටසක් ද දැකගත හැකිය. මෙම වැව් බැම්ම එක් පසකින් ස්තූපයට සම්බන්ධ කර ඇති අතර අනෙක් පසින් ගල් කෙමියක් සහිත පර්වතයකට සම්බන්ධ කර ඇත. කෙසේ වුවද මෙම පුරාවිද්‍යා ස්මාරකයේ ආගමික අගය පිළිබඳව හෝ නොසලකා සිදුකර ඇති මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුව ඇති විනාශය අඩු තක්සේරුවකට ලක්කළ නොහැක.

**සමාලෝචනය**

සමාජ නවීකරණයේ දී ඇතිවන්නා වූ ආර්ථික අභියෝගයන්ට මුහුණ දීමට සෑම මානව සමාජයකටම පාහේ සිදුවෙයි. මෙහි දී සමාජය තුළ මුල්බැසගත් ප්‍රතිමාන පද්ධතීන් පවා ඇතැම්විට අභිබවා යන ආකාරය දැකිය හැකිය.ශ්‍රී ලංකාවේ අතීත සංස්කෘතිය සකස් වීමේ දී වැව, දාගැබ, ගම, පන්සල යන ඒකකයන් අතර පැවතියා වූ මනා සබඳතාවය හේතුවෙන් ස්තූපය සුරකීමට ගම්වැසියෝ නිතතින්ම හුරුවූ හ. තව ද වැව් ඉදිකිරීමේ දී ස්තූප විනාශ කිරීමට අතීත ලාංකිකයන් කටයුතු නොකළ අතර වත්මනෙහි දී ග්‍රාමීය ජන කණ්ඩායමක් ස්වකීය වැවක් ඉදිකිරීමට වෙහෙරක් බිඳ ඇති ආකාරය දැකගත හැකිය. මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 147 සී කිවුල්ආර ගම්මානය මධ්‍යයේ හුදකලා කඳු ගැටයක් මත පිහිටි මෙම පුරාවිද්‍යා භූමියෙහි පසෙක පිහිටි ස්තූපයට බස්නාහිර දෙසින් මීටර් පණහක පමණ දිග වැව් බැම්මක් සම්බන්ධ කර ඇත .කෙසේ වුව ද මේ තුළින් පැහැදිලි වනුයේ සංස්කෘතික,ආගමික,පුරාවිද්‍යාත්මක අගයන් අභිබවා ආර්ථික අවශ්‍යතාවය ස්මතු වීමක් දෝ හෝ යි යන්න විමසිය යුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ආනන්ද, ගුරුගේ (2007). *මහාවංශය. ( සංස්),* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

*ඌව වංශ කථාව,* (1994) (සංස්.) පළාත් සංස්කෘතික අමාත්‍යාංශය, බදුල්ල.

ගුණවර්ධන, රණවීර (1993). *සිවුර සහ නඟුල.* කොළඹ:සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

බණ්ඩාර, සීවලී. (2001). *පුරාවිද්‍යා ගවේෂණය,*. පිට කොට්ටේ: J&D මුද්‍රණාලය.

බස්නායක, එච්.ටී, සහ හෙට්ටිගේ, (2008). *පුරාවිද්‍යා ප්‍රවේශය.* කොළඹ: එස් ගොඩගේ සහ සමාගම.